# මූලයන් සොයමින් අයිතීන් දිනාගැනීමට

මෙරට කඳුකරයේ වතුවල වැඩ කිරීම සඳහා මෙරටට මුලින්ම රැගෙන එන ලද කාන්තා සහ පිරිමි පුද්ගල කණ්ඩායම් පැමිණි *ගමන අපි යළිත් සොයමින් සිටින්නෙමු.* වසර ගණනාවක් මුළුල්ලෙහි දහස් සංඛ්‍යාත පිරිසක් මන්නාරමට ගොඩබැස එතැන් සිට මාතලේ දක්වා අනතුරුදායක ගමනක් පාගමනින් ගියහ. ඔවුහු රෝග විඳදරා ගනිමින්, කැලෑ එළිපෙහෙළි කරමින්, වනසතුන්ට නිර්භයව මුහුණදෙමින් ගමන් කළහ. බොහෝදෙනෙක්, ඇතැම් කණ්ඩායම්වල 40%කට අධික පිරිසක්, ගමන අතරමඟදී මියගිය අතර, ඔවුන්ගේ සිරුරු භූමදානය කරන ලදී, නැතහොත් බැහැරකර දමන ලදී. මෙයට වසර දෙසියයකට පෙර මෙම දුෂ්කර මඟ පියමං කළ එම මුල්ම පරම්පරාව පිළිබඳ ආවර්ජනයකර, ඔවුන් සමඟ සම්බන්ධවන වන්දනා ගමනක් වූ මෙම ගමනට අප සමඟ එක්වන ලෙස අපි ඔබ සැමට ආරාධනා කරන්නෙමු.

මලෙයහ එළුච්චි පයනම් *අනාගතය* පිළිබඳවද වේ - එය ශ්‍රී ලංකාවේ නිදහස් හා සමාන පුරවැසියන් ලෙස පිළිගන්නා මෙන් මලෙයහ දෙමළ ප්‍රජාව විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම පිළිබඳවය. මෙයට වසර දෙසීයකට පෙර මෙරටට පැමිණි දා සිට ඔවුන්ගේ පැවැත්ම සඳහා අරගලයක නිරතවීමට සිදුවී තිබේ. ශ්‍රී ලංකාවේ වෙනම සහ මූලික ජන කණ්ඩායමක් ලෙස පිළිගනිමින් සමාන සැලකීමක් ලබාදෙන ලෙස ඉල්ලා වරින්වර බලයට පත්වූ රජයන් වෙත ඉදිරිපත් කළ අඛණ්ඩ ආයාචනාවලින් අපගේ ඉල්ලීම් සමන්විත වේ. මෙය අනෙකුත් ප්‍රධාන ප්‍රජාවන් හා සමානව ස්වාධීන ලංකාවේ/ශ්‍රී ලංකාවේ ජන කණ්ඩායමක් ලෙස අනන්‍යතාවක් සඳහා වන මෙම ප්‍රජාවගේ අරගලය ප්‍රතිරාවය කරයි.

'මලෙයහ එළුච්චි පයනම්' අපගේ සහෘද ජනතාව සමඟ සිදු කරන *සංවාදයක්ද* වේ. මලෙයහ දෙමළ ප්‍රජාවගේ ඉතිහාසය, අරගල, ජයග්‍රහණ, ඔවුන්ගේ දායකත්වය, වත්මන් සමාජ-ආර්ථික හා දේශපාලන තත්ත්වය සහ අභිලාෂයන් පිළිබඳව සිංහල, ශ්‍රී ලාංකික දෙමළ, මුස්ලිම් සහ අනෙකුත් සහෝදර ජනතාව අතර මූලික අවබෝධයක් ඇති කිරීම මෙම ගමනේ අරමුණයි.

'මලෛයහ එළුච්චි පයනම්' සියලුදෙනාට *විවෘතය.* සියවස් දෙකක කාලයක් පුරා මලෛයහ දෙමළ කාන්තාවන් හා පිරිමින් විසින් ලබාදුන් දායකත්වය පිළිබඳ ඔබගේ ඇගයීම ප්‍රදර්ශනය කිරීම සඳහාත්, *මලෛයහ දෙමළ ප්‍රජාව* වෙත සහයෝගීතාව දක්වමින් ඔබේ හඬ එක් කිරීම සඳහාත්, අප සමඟ එක්ව ඇවිදීමට අපි ඔබ සැමට ආරාධනා කරන්නෙමු. කිලෝමීටර කිහිපයක්, සම්පූර්ණ දවසක් හෝ සම්පූර්ණ ගමන පුරා අප සමඟ සම්බන්ධවීමට අපි ඔබට සාදරයෙන් ඇරයුම් කරන්නෙමු. මෙම ගමන්මාර්ගය පුරා සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන්වලටද ඔබට සහභාගී විය හැකිය.

ඔබට මෙම පාගමනට සහභාගීවීමට නොහැකි නම්, පාගමනට සමගාමීව ඔබ ප්‍රදේශයේ විවිධ ක්‍රියාකාරකම් දියත් කරමින්, චිත්‍ර, රචනා, ගීත, වීඩියෝ සහ සමාජ මාධ්‍ය පළකිරීම් හරහා නිර්මාණාත්මක ලෙස පාගමනට සහයෝගය දැක්වීමට ඔබව උනන්දු කරන්නෙමු. ගෞරවාන්විතව සැලකීමට සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වශයෙන් පූර්ණ හා අර්ථවත් ලෙස සහභාගීවීමට මලෛයහ දෙමළ ජනතාවගේ ගමනේදී ඔවුන්ගේ අතීතය, වර්තමානය සහ අනාගතය පිළිබඳ සංවාදයක සහ සාකච්ඡාවක නිරතවීමට අපි අපගේ සහෝදර පුරවැසියන් දිරිමත් කරන්නෙමු.

***මන්නාරම සිට මාතලේ දක්වා ගමන් මාර්ගය සහ වැඩසටහන් සැලසුම****

| **දිනය** | **මාර්ගය / ස්ථානය** | **දුර** | **වැඩසටහන්** |
|---|---|---|---|
| 2023 ජූලි 28 | තලෛයිමන්නාරම | | සමාරම්භක උත්සවය |
| 2023 ජූලි 29 | තලෛයිමන්නාරම සිට පේසාලෙයි දක්වා | කි.මී. 15 | |
| 2023 ජූලි 30 | පේසාලෙයි සිට මන්නාරම නගරය දක්වා | කි.මී. 16 | මන්නාරම නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| 2023 ජූලි 31 | මන්නාරම නගරයේ සිට මුරුන්කන් දක්වා | කි.මී. 26 | |
| 2023 අගෝස්තු 01 | මුරුන්කන් සිට මඩු දක්වා | කි.මී. 26 | මඩු නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| 2023 අගෝස්තු 02 | මඩු | | |
| 2023 අගෝස්තු 03 | මඩු මංසන්ධියේ සිට චෙඩ්ඩිකුලම් දක්වා | කි.මී. 23 | චෙඩ්ඩිකුලම් නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| | | | එදිනම වව්නියාව නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| 2023 අගෝස්තු 04 | චෙඩ්ඩිකුලම් සිට මැදවච්චිය දක්වා | කි.මී. 26 | |
| | එදිනම වව්නියාව සිට මැදවච්චිය දක්වා | කි.මී. 26 | මැදවච්චිය නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| 2023 අගෝස්තු 05 | මැදවච්චිය | | |

| | | | |
|---|---|---|---|
| 2023 අගෝස්තු 06 | මැදවච්චිය සිට මිහින්තලේ දක්වා | කි.මී. 22 | මිහින්තලේ නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| 2023 අගෝස්තු 07 | මිහින්තලේ සිට තිරප්පනේ දක්වා | කි.මී. 18 | තිරප්පනේ නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| 2023 අගෝස්තු 08 | තිරප්පනේ සිට කැකිරාව දක්වා | කි.මී. 22 | කැකිරාව නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| 2023 අගෝස්තු 09 | කැකිරාව සිට දඹුල්ල දක්වා | කි.මී. 22 | දඹුල්ල නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| 2023 අගෝස්තු 10 | දඹුල්ල | | |
| 2023 අගෝස්තු 11 | දඹුල්ල සිට නාලන්ද දක්වා | කි.මී. 22 | නාලන්ද නගරයේ පැවැත්වෙන වැඩසටහන |
| 2023 අගෝස්තු 12 | නාලන්ද සිට මාතලේ දක්වා | කි.මී. 24 | සමාප්ති උත්සවය |

*වැඩසටහන් පැවැත්වෙන ස්ථාන සහ වැඩි විස්තර සහිත මෙම සැලැස්ම යාවත්කාලීන කරනු ලැබේ.

මන්නාරම සිට මාතලේ දක්වා වන පාගමන සහ වැඩසටහන් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය සහ පුළුල් සිවිල් සමාජ සංවිධාන සමූහයක් හා මලෙයහ ප්‍රජාවට අයත් සහ/හෝ ඔවුන් සමඟ කටයුතු කරන පුද්ගලයින්ගෙන් සමන්විත 'මාන්බුමිගු මලෙයහ මක්කල් සාමූහිකය' විසින් සංවිධානය කරනු ලැබේ.

ඔබ මෙයට සම්බන්ධවීමට, සහභාගීවීමට සහ/හෝ ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වීමට අදහස් කරන්නේ නම් කරුණාකර අප අමතන්න:

1. එස්. දේවදාසන් 0767341855
2. ගරු එම්. සාමිනාතන් පියතුමා 0712610747
3. ඩැනියෙල් ජේසුදාසන් 0777034136
4. ජේ. සුර්ෂේ 0779915459

*අභියාචනය*

මෙරටට පැමිණ වසර 200ක් සම්පූර්ණවීම සමරන මලෙයහ ප්‍රජාව ශ්‍රී ලංකාවේ ජනජීවිතයට පූර්ණ / අර්ථවත් ලෙස සහභාගීවෙමින්, පූර්ණ සහ සමාන පුරවැසියන් බවට පත්වීමට අභියාචනයක් ඉදිරිපත් කරති. මන්නාරම සිට මාතලේ දක්වා වන පාගමන ආවර්ජනය කිරීමේ ගමනක් මෙන්ම, ඔවුන්ගේ මෙම අභියාචනයට සහාය දක්වන සහයෝගීතා පාගමනක්ද වේ.

ශ්‍රී ලංකාවේ අර්ථවත් පුරවැසියන් වීමට මලෙයහ දෙමළ ජනතාව ඉල්ලා සිටිනුයේ

(I) අපගේ ඉතිහාසය, අරගලය සහ දායකත්වය පිළිගැනීම

(II) අනෙකුත් ප්‍රධාන ප්‍රජාවන් හා සමානව වෙනමම අනන්‍යතාවක් සහිත, නිදහස් ශ්‍රී ලංකාවේ ජන කොටසක් ලෙස පිළිගැනීම

(III) ජාතික මට්ටමේ සාමාන්‍යයන් හා සමාන මට්ටමක් ළඟාකර ගැනීමට අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණයන් සම්බන්ධ සාධනීය ක්‍රියාමාර්ග

(IV) ජීවත්වීමට සරිලන වැටුපක්, ගෞරවනීය රැකියා, නෛතික ආරක්ෂාව සහ පිරිමි හා කාන්තා කම්කරුවන්ට සමාන වැටුප්

(V) නිවාස සහ ජීවනෝපාය සඳහා සුරක්ෂිත හිමිකමක් සහිත ඉඩම්

(VI) දෙමළ භාෂාව සමාන ලෙස භාවිතය සහ ඒ සඳහා සමාන තත්ත්වයක්

(VII) රාජ්‍ය සේවා වෙත සමාන ප්‍රවේශය

(VIII) වැවිලි අංශයේ ජනාවාස නව ගම්මාන ලෙස සීමා නිර්ණය කිරීම

(IX) ගෘහස්ථ සේවකයින් ආරක්ෂා කිරීම

(X) මලෙයහ සංස්කෘතිය සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම

(XI) රාජ්‍ය පාලනයේ සෑම මට්ටමකදීම අර්ථවත් පාලන කාර්යභාරයක් හිමිවන පරිදි සමානාත්මතාව සහිත සහ අන්තර්කරණය වූ මැතිවරණ ක්‍රමයක් සහ බලය බෙදීමක්.

**සමාන පුරවැසියන් ලෙස පිළිගනු ලැබීම සඳහා වන අභියාචනයෙහි පසුබිම**

නිදහසින් පසු මලෙයහ දෙමළ ජනතාව විසින් ප්‍රකාශ කරන ලද ඉල්ලීම් තුළ ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රජාවන් හා සමානව ඔවුන් පූර්ණ පුරවැසියන් ලෙස පිළිගැනීමක් ලබාදීම ඇතුළත් විය. සමානාත්මතාව, වෙනස්කොට නොසැලකීම, ආරක්ෂාව සහ ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ අනන්‍යතාව ආරක්ෂා කෙරෙන දේශපාලන හා පරිපාලන විධිවිධාන සඳහා ඉල්ලීම්කර ඇත. මෙම ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබුවේ නුවරඑළිය ප්‍රදේශයේ සංකේන්ද්‍රණයවී, ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශ ගණනාවක විසිරී ජීවත්වන මෙම ජනතාවට අභිමානයෙන්, ආත්ම ගරුත්වයෙන්, සාමයෙන් සහ සුරක්ෂිතභාවයෙන් යුතුව ජීවත්වීමට සහ ඔවුන්ගේ කටයුතු කළමනාකරණයකර ගැනීමට අවශ්‍ය හඬ සහ බලය ලබාගනු පිණිසය.

1820 දශකයේ මුල් භාගයේ සිට බ්‍රිතාන්‍ය කිරීටය යටතේ පැවති සමාගම් විසින් ඉන්දියාවේ සිට එකල 'සිලෝන්' නමින් හඳුන්වන ලද ශ්‍රී ලංකාවට මලෙයහ දෙමළ ප්‍රජාව රැගෙනඑන ලදී. බ්‍රිතාන්‍යයින් විසින්

මෙරට 'වතු රාජ්‍යය' ගොඩනැගීමට  යොදාගත් පදනම වූයේ එම ප්‍රජාවගේ ශ්‍රමයයි. ඔවුන් යටත්විජිත ව්‍යවසායන්හි අත්‍යවශ්‍ය කොටසක් විය. නිදහස දිනාගත් අවස්ථාව වන විට මෙම ප්‍රජාව මෙරට සිටි දෙවන විශාලතම ජනවාර්ගික කණ්ඩායම විය. එහෙත්, නිදහස ලබාගත් වහාම නිදහස් ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29(2) ව්‍යවස්ථාව මඟින් සුළුතර කණ්ඩායම්වලට ආරක්ෂාව සලසාදුන් විධිවිධාන උල්ලංඝනය කරමින් මෙම ප්‍රජාවට පුරවැසිභාවය අහිමි කරන ලදී. ඉන්අනතුරුව බොහෝදෙනෙකු අත්තනෝමතික සහ කැමැත්තෙන් තොරව ඉන්දියාවට ආපසුයවනු ලැබීය. මේ හේතුවෙන් මෙම ප්‍රජාවගේ දේශපාලන තත්ත්වය සහ සමාජ ආර්ථික යහපැවැත්ම බොහෝසෙයින් හීනවිය.

සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම (1964) සහ සිරිමා-ඉන්දිරා ගිවිසුම (1974) ඇතුළුව ඉන්දියාව සමඟ ඇති කරගත් ද්විපාර්ශ්වික ගිවිසුම් හරහා දසදහස් සංඛ්‍යාත පිරිසක් ඉන්දියාවට පිටුවහල් කරන ලද අතර, තවත් දහස් ගණනකට පුරවැසිභාවය අහිමි කරන ලදී. මෙහිදී නිසි පරිදි ප්‍රජාවගේ අදහස් විමසීමක් සිදුවූයේ නැත. මෙය මෙම ප්‍රජාවෙහි සාමාජිකයින් තුළ ඉමහත් සන්තාපයක් ඇති කළ අතර, ඔවුන්ගෙන් බොහෝදෙනෙකු තම ඥාතීන්ගෙන් වෙන්වීමට ලක්විය. පුරවැසිභාවය නොමැති ගැටළුව විසඳාගැනීමට සහ මෙම ප්‍රජාවේ සාමාජිකයින්ට විධිමත් පුරවැසිභාවය ලබාගැනීමට දශක කිහිපයක් පුරා අරගල කිරීමට සිදුවිය. එහෙත්, වෙනත් බොහෝ දේශපාලන, පරිපාලන සහ සමාජ-ආර්ථික ක්ෂේත්‍රවල ප්‍රගතිය මන්දගාමී සහ සීමාසහිත මට්ටමක පවතියි.

**වර්තමාන තත්ත්වය**

වතුවල පදිංචිකරුවන් ලෙස සිටින 500,000ට අධික පිරිස ඇතුළු මලෙයගහ දෙමළ ප්‍රජාවේ වර්තමාන තත්ත්වය වනාහි ස්වකැමැත්තෙන් තොරව මෙරටින් පිටමං කිරීම, බලහත්කාරයෙන් පුරවැසිභාවය අහිමි කිරීම, පුරවැසිභාවය පිළිබඳ අවිනිශ්චිතභාවය සහ ඡන්ද බලය නොමැතිවීම යන අතීත ඉතිහාසයේ ප්‍රතිඵලයකි. මෙය ප්‍රජාවගේ සමාජ-ආර්ථික යහපැවැත්ම කෙරෙහි බලපා ඇත. වැඩිම බලපෑමට ලක්වූ කණ්ඩායම වනුයේ වතුවල ජීවත්වන සහ වැඩ කරන පිරිසයි. ඔවුන් මෙරට අනෙකුත් සියලුම ප්‍රජාවන් හා සැසඳීමේදී මානව සංවර්ධන දර්ශක සියල්ලෙන්ම අඩුම අගයන් වාර්තා කරන රටේ වඩාත්ම කොන්වීමට ලක්වූ කණ්ඩායම බවට පත්ව ඇත. මෙම තත්ත්වය වතු හාම්පුතුන්ට බැඳී සිටින සහ ඔවුන් මත යැපෙන කම්කරුවන්ව සිටීමේ තත්ත්වයෙන් මිදී, අන් අය හා සමාන අයිතිවාසිකම් සහිත ශ්‍රී ලංකාවේ පූර්ණ පුරවැසියන් තත්ත්වයට පරිවර්තනය වීමට දැඩිව බාධාකාරීවී ඇත.

ඉහත සඳහන් කළ වතුකර ප්‍රජාවෙන් විශාල ප්‍රමාණයක් තවමත් අවම ජල සහ සනීපාරක්ෂක පහසුකම් සහිත ලයින්කාමර නිවාසවල ජීවත්වෙති. ළදරු මරණ, උපත් බර සහ වයසට සරිලන උස ඇතුළු බොහෝ සෞඛ්‍ය සහ පෝෂණ දර්ශක මෙරට ජාතික සාමාන්‍ය අගයන්ට සාපේක්ෂව පරම්පරාගත ලෙස පහළ මට්ටමක් පෙන්නුම් කරයි. වතුකරයේ ළමයින් දශක ගණනාවක් තිස්සේ ජාතික අධ්‍යාපන පද්ධතියෙන් බැහැරකර ඇති බැවින් සැලකිය යුතු මට්ටමක අහිමි කිරීමක් නිර්මාණයකර ඇති අතර එය තවමත් සම්පූර්ණයෙන් නිවැරදිකර නොමැත. වතුවල ජීවත්වන ජනතාවට සේවා සපයන සෞඛ්‍ය පහසුකම්

තවමත් ප්‍රධාන ධාරාවෙහි නොමැත. ඒ හා සමානවම, මෙම ජනගහනයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ඇතුළු අධ්‍යාපනයෙහි සාධන මට්ටම්වලට ළඟාවීම සැලකිය යුතු ලෙස අඩු අගයක් ගනී. අනෙකුත් ප්‍රජාවන්ට සාපේක්ෂව සලකාබැලීමේදී, මලෙයහ දෙමළ ප්‍රජාව රාජ්‍ය අංශයේ රැකියාවල සහ තෘතීයික අධ්‍යාපනයෙහි නිරතවී සිටීම ඉතා අඩු මට්ටමක පවතින අතර, ඉඩම්, පරිපාලන සේවා සහ සුබසාධන වැඩසටහන් සඳහා ඇති ප්‍රවේශයෙහි දැඩි අසමානත්වයක් පවතියි. බොහෝදෙනෙකුට ලිපිනයක් නැත. මෙම ප්‍රජාවේ සාමාජිකයින් අතර දරිද්‍රතා අනුපාතය ජාතික සාමාන්‍ය අගයට වඩා සැලකිය යුතු ලෙස ඉහළය. ඔවුන් ආපදාවලට ලක්වීමේ වඩාත්ම වැඩි අවදානම සහිත, එහෙත් රජයේ ආපදා පෙරසූදානම් සහ අවම කිරීමේ ක්‍රියාමාර්ගවලට අඩුවෙන්ම ඇතුළත්කර ඇති පිරිස වේ.

ප්‍රජාවේ දේශපාලන තත්ත්වය සහ සමාජ-ආර්ථික යහපැවැත්ම එකිනෙකට සමීපව බැඳී ඇති බව අපි විශ්වාස කරන්නෙමු. දීර්ඝ කාලයක් පුරා වෙනස්කොට සැලකීම, පුරවැසිභාවය නොමැතිවීම, ඡන්ද අයිතිය අහිමිවීම සහ ඉන්පසුව සිදුවූ ජනගහනය අඩුවීම අද දක්වාම දීර්ඝ සෙවණැලි නිර්මාණය කරමින් තිබෙන අතර අපගේ ඉල්ලීම්වල ස්වරූපයද හැඩගස්වා ඇත. මෙම ප්‍රජාව පීඩාවට ලක්කළ ව්‍යුහගත ප්‍රචණ්ඩත්වයේ චක්‍ර, එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවන අභ්‍යන්තර හා බාහිර අවතැන්වීම්, ඔවුන් විසින් අත්විඳිනු ලබන වෙනස් ආකාරයේ හා අසාධාරණ සැලකීම් සහ අඛණ්ඩ කොන්කිරීම් අපගේ අභියාචනයට වැඩි හදිසිභාවයක් එක්කර ඇත.

Gmail: maanbumigumalaiyaham@gmail.com, m.n.yathrai2023@gmail.com

FB: (https://web.facebook.com/profile.php?id=100094920310954)

Twitter: @malaiyaham